# දෙවියෝ කෝප වෙලා...



W.A. සතිනි යෙතුම්සා වීරසිංහ

# ඩේසියෝ කෝණ මෙලා...

(ISBN : 978-624-208-329-0)

3 වන E පොත දිග හැරුම

W.A. සතිනි යෙතුම්සා වීරසිංහ

මහාමායා බාලිකා විදුහල - මහනුවර

5 ශ්‍රේණිය

වෙනත් කෘති -

| | |
|---|---|
| ඉවී සහ එලා | - (ISBN : 978-624-96932-1-0) |
| ආදර අම්මා සහ අප්පච්චී | - (ISBN : 978-624-96932-0-3) |
| The Shapes | - (ISBN : 978-624-96932-2-7) |
| වැරදුණු උගුල | - (ISBN : 978-624-206-653-0) |
| සුදු මහත්තයාගේ ඇස් | - (ISBN : 978-624-206-921-0) |

# පිදුම

පාසල් ප්‍රජාවම ආදි කර්තෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන්
වහන්සේට උපහාර පිණිස හා
මහාමායා 93වන සංවත්සරය වෙනුවෙන්
සංවිධාන කරන
හෙරණගත්කරණී E - book ව්‍යාපෘතියට සමගාමීව
මා විසින් රචනා කරන ලද මෙම ග්‍රන්ථය
මාගේ සෙවනැල්ල මෙන් ළඟ සිටින
ආදරණීය අම්මාට හා අප්පච්චීට මෙය පිදුමක් ම වේවා.
එමෙන්ම ගරු විදුහල්පතිතුමිය ඇතුලු මෙම ව්‍යාපෘතියේ දී
සහයෝගය දුන් සියලුම දෙනාට ද
මෙම සංකල්පය අප වෙත ළඟා කරදුන්
සෙනෙවිරත්න ගුරු පියාණන්ට ද
පිදුමක් වේවා.



## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කර්තෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඔන්න එකෝමත් එක රටක හිටියලු නිතර දඟ වැඩ කරන ළමයි හිටපු පවුලක්. වැඩිමහල් පුතාගේ හුරතල් නම ජැකී. මොකද එයා කොස් කන්න ආසයි. දෙවැනි පුතාගේ නම විපරමා. මොකද එයා හැමවෙලේම එක එක දේවල් හදනවා, අත්හදා බලනවා, බය නෑ. තුන්වෙනි ළමයා ගැහැනු ළමයෙක් එයාගේ හුරතල් නම් ඩොලී. එයාට ලස්සන ලොකු ඇස් දෙකක් තියෙනවා. මෙයාලගේ දඟ වැඩවලට උදව් වෙන නෑකමට මාම වෙන සම වයසේ ළමයෙකුත් හිටියා. එයාගේ නම ශානෙ. මේ හතර දෙනා එකතු උනා ම මොනවයින් මොනවා වෙනවද කියලා හිතාගන්න බෑ.

ඔන්න දවසක් මෙයාල කඩයක් දාන්න තීරණය කළා. අපි අඹ කඩයක් දාමු කට්ටියම ඒකට කැමති වුණා. විපරමා කඩේ කණු හිටවලා හැදුවා. ජැකී අඹ තියන්න මේසයකුත් හැදුවා. ඩොලීයි ශානෙයි අවට තිබ්බ මී අඹ ගහකින් ගෙඩි කැඩුවා. වැටිලා තිබ්බ හොඳ ගෙඩිත් ඇහිලුවා.






හැබැයි මේ කඩේ හැදුවේ පොඩි බැවුමක් ගාව. ඊට පස්සේ මේ හතරදෙනා නෑදෑ ගෙවල්වලට ගිහිල්ලා, "අඹ තියෙනවා නැන්දේ, අඹ තියෙනවා මාමේ, අපි අඹ කඩයක් දානවා, අඹ ගන්න එන්න, රසම රස මී අඹ තියෙනවා," කියන පණිවිඩය කිව්වා.



ඔන්න දවස උදාවුනා. දේව රූපයකුත් තියලා, පහනකුත් පත්තු කරලා, හඳුන්කූරක්, ගහලා කඩේ විවෘත කළා. දැන් ඉතින් ඔන්න මේ හතර දෙනා බලන් ඉන්නවා කවුරු හරි කඩේට එනකන්.



ඩොලීට මේ අස්සෙ බඩගින්නක් ඇවිල්ලා. ජැකී එක්ක එකතුවෙලා අඹ මේසෙන් අඹ ගෙඩි දෙකක් හොරාට අරගෙන, අඹ ගෙඩියේ පොත්ත පොඩ්ඩක් හිල් කරලා ඇතුලේ තියෙන අඹ යුෂ හෙමින් හෙමින් උරලා බිව්වා. දැන් අඹේ පැත්තක්ම හිස්. හොරේ අහුවෙයි කියලා බයට අර පොත්ත හිල් කරපු

තැනින්ම කට තියලා අඹේට පිම්බා. දැන් අඹ ගෙඩිය කලින් වගේම හොඳට පිම්බිලා තියෙනවා. ඊට පස්සේ එයා අඹ ගෙඩිය හොරෙන්ම මේසය උඩින් තිබ්බා.





නැදෑයෝ එක්කෙනා දෙන්නා ඇතින් එනවා පේනවා. විපරමා සතුටින් අඹ මේසෙ දිහා බැලුවා. අර හුළං පුම්බපු අඹ දෙකේ හුළං බැහැලා මැලවිලා ගිහින් තිබ්බා. විපරමා මේක දැක්කා. අතට අරන් බලද්දි ගෙඩියේ හිල් දෙකක් තියෙනවා දැකලා විපරමාට හැමදේම තේරුම් ගියා.



විපරමා කට්ටිය දිහා බැලුවා. එතකොට ඩොලීයි ජැකියි හරි බයෙන් එතනින් දිව්වා. කලබලයට ඩොලීගේ කකුල මේසයේ වැදුණා.

ඊට පස්සේ මේසේ තිබ්බ අඹ ටික රෝල් වෙලා පල්ලෙහාට පෙරලුණා. ඒ අතරේ අර දෙවි රූපෙත් දඩස් ගාලා වැටුණා. පහනත් වැටුණා. තෙල් ඔක්කොම ඉහිරුණා. ඒ අස්සෙ ශානෙ "මෙන්න දෙයියෝ කෝප වෙලා..... මෙන්න දෙයියෝ කෝප වෙලා...." කියලා කෑ ගැහුවා.



හැමෝටම ඉතිං හිනා. කට්ටියම එකතුවෙලා අඹ මේසය ආයෙත් හැදුවා. දෙවි රූපයත් තිබ්බා. තෙල් ටිකක් කොහොම හරි හොයාගෙන, මාමා කෙනෙක් පහන ආයෙම පත්තු කළා.



අර හිල් කරපු  අඹ දෙක ඩොලීටයි ජැකීටයි කන්න දුන්නා. ඒ දෙන්නා ඒක රහ කර කර කෑවා. අඹ සේරමත් විකිණුනා. හැමෝටම සතුටුයි.



**නිමි...**



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කරගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්